**සීමාසහිත රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම - 2021/2022**

**-------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගමේ ( "සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත , 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය | සමාගමක ශුද්ධ වත්කම් ඒ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු බව පෙනී යන අවස්ථාවකදී සමාගමට දැරීමට සිදුවී ඇති පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය, සමාගමට දැරීමට සිදුවී ඇති පාඩුවට හේතුව හෝ හේතු, සහ එවැනි පාඩු තවදුරටත් සිදුවීම වැලැක්වීම සඳහා හෝ දැරීමට සිදු වූ පාඩු පිරිමසා ගැනීම සඳහා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවර කිසිවක් ගෙන ඇත්නම් ඒ පියවර පිළිබඳ කොටස් හිමියන්ට දැනුම් දෙමින් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වාර්තාවක් පිළියෙල කර එම වාර්තාව සමඟ ඒ සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් ඒ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කැඳවනු ලැබිය යුතුය. නමුත් සමාගම සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 2.65 ක ශුද්ධ පොත් අගය සෘණ වටිනාකමක් වී තිබියදීත් එකී රෙගුලාසි ප්‍රකාරව වාර්තාවක් පිළියෙල කිරීමට හෝ රැස්වීමක් කැඳවීමට හෝ 2024 මාර්තු 31 වන විටත් කටයුතු කර නොතිබුණි. | 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022හි සඳහන් උපදෙස් වලට අනුගත වෙමින් 2022.07.07 දින සිට රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් ලිමිටඩ් සමාගම යටතේ දියත් කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ සියලු ක්‍රියාකාරකම් අත්හිටුවීමට කටයුතු කර ඇති බැවින් 2023.06.30 දින පැවති 153 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත 153(06) දරන මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර එම මණ්ඩල පත්‍රිකාවට අනුව සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිත්‍යානුකූලව රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් ලිමිටඩ් සමාගම වසා දැමීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලෙසට අනුමැතිය ලබාදී ඇති බව දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 ජුනි මස 15 දින රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර තිබූ යෝජනා සම්මුතියේ 1.10 ඡේදයේ දැක්වෙන පරිදි එවකට රටේ පැවති කාබනික පොහොර හිඟයට පිළියමක් ලෙස කාබනික පොහොර නිශ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කරන ලෙසට ජනාධිපති කාර්ය සාධක බලකාය මඟින් දැනුම් දී ඇති බව දක්වා තිබුණි. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සඳහා මෙම (RPML) රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම පිහිටුවා තිබූ අතර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ අරමුණු කිසිවක් දක්වා නොතිබූ නමුත් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද යෝජනා සම්මුතියක් පමණක් ඇතුලත් කිරීමෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. කාබනික පොහොර නිෂ්පාදන කටයුතු වලින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මිලියන 2.65 අලාභයක් ලබා ඇති අතර 2022 ජුලි 07 දින සමාගමේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ සියළු ක්‍රියාකාරකම් නවතා දමා තිබූ නමුත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොතිබුණි. | සීමාසහිත රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සමාගමක් වන බැවින් එය නීත්‍යානුකූලව වසා දැමීම සඳහා සමාගම් පනත යටතේ පවතින ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කළයුතු අතර 2023.06.30 දිනැති 153 වන අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද 153(06) දරන මණ්ඩල පත්‍රිකාව සඳහා උපදෙස් ලබාදෙමින් නීත්‍යානුකූල ලෙසින් මෙම සමාගම වසා දැමීමට අදාළව ඉදිරි අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස්දී ඇත. එම උපදෙස් පරිදි සීමාසහිත රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම වසා දැමීම සඳහා විගණනය කරන ලද සමාගමේ ගිණුම් වාර්තා අනිවාර්ය වන අතර එම ගිණුම් වාර්තා ලබාගැනීමෙන් අනතුරුව මෙම සමාගම වසාදැමීමට අදාළ ඉදිරි කටයුතු සිදුකළ හැකි වනු ඇත. ඒ අනුව විගණන නිරික්ෂණයේ තවදුරටත් සඳහන් පරිදි කාබනික පොහොර ව්‍යාපෘතිය සමස්ථ රට තුළම අසාර්ථකවූ ව්‍යාපෘතියක් බැවින්, මූල්‍ය අලාභයක් සිදුව ඇති බව පිළිගත හැකිවේ. | අසාර්ථක වූ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |